## ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය - 2016

---

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 මතය ව්‍යාචනය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

---

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

---

(i) ප්‍රමිතයෙහි 15 ඡේදය ප්‍රකාරව, ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන මගින් සාධාරණව ඉදිරිපත් කළ යුතුය. එහෙත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් අංක 4 යටතේ දක්වා ඇති දේපල පිරියත උපකරණවලට සිදුකර තිබූ රු.87,826,716 ක ගැලපීම් හා රු.146,667 ක ක්ෂය ප්‍රතිපාදනය සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ii) දේපල පිරියත හා උපකරණ , ජීව විද්‍යාත්මක වත්කම් හා ගොවිපලවල් 32 සඳහා පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමිතයෙහි 38 ඡේදය ප්‍රකාරව අනුරූපී පෙර වර්ෂයේ අගයන් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ප්‍රමිතයෙහි 79 (ආ) ඡේදය ප්‍රකාරව, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයේ ඇතුළත් රු.130,696,928 ක් වූ ප්‍රාග්ධන සංචිත, රු.44,529,422 ක් වූ ආදායම් සංචිත හා රු.37,500,000 ක් වූ බඩඉරිඟු ව්‍යාපෘතියට අදාළ චක්‍රීය අරමුදල් ශේෂය පවත්වාගෙන යාමේ අරමුණු හා ඒවායේ ස්වභාවය හෙළිදරව් කර නොතිබුණි.

(iv) කාර්යය අනුව ආදායම් ප්‍රකාශනයෙහි වියදම්, ඉදිරිපත් කර තිබූ අතර එම වියදම් වල ඇතුලත් වූ ව්‍යාපෘති 4 හා ගොවිපලවල් 32 ක වියදම් ප්‍රමිතයේ 104 ඡේදය ප්‍රකාරව ඒවායේ ස්වභාවය පිළිබඳ අතිරේක තොරතුරු සටහන් මගින් ඉදිරිපත් නොකර ව්‍යාපෘතියේ නමින් ඉදිරිපත් කර තිබුණි.

(v) කෙරීගෙන යන වැඩ හා කල්බදුවලට අදාළ ගිණුම් ප්‍රතිපත්තිය ප්‍රමිතයෙහි 117 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08**

---

(i) මණ්ඩලය විසින් ජීව විද්‍යාත්මක වත්කම් අගය කිරීමේදී 2015 වර්ෂයේ දී දේශීය ගවයන් සඳහා සියයට 25ක උපලබ්ධි නොවන ලාභ වෙන් කිරීමක් සිදුකර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දී මෙම වෙන්කිරීම සියයට 10 දක්වා අඩු කර තිබුණි. කෙසේවුවද, ප්‍රමිතයෙහි 19(ආ) ඡේදය ප්‍රකාරව ගිණුම් ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමෙන් වන බලපෑම අතීතානුයෝගීව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකර නොතිබුණි.

(ii) ප්‍රමිතයෙහි 42 ඡේදය ප්‍රකාරව ප්‍රමාණාත්මක වූ පෙර කාලපරිච්ඡේද වැරදි, ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදුවූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදිකර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10**

---

2014 වර්ෂයේ මණ්ඩලය විසින් පාලනමය අයිතිය පවරාගන්නා ලද ආශ්‍රිත සමාගමක් වන සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පෞද්ගලික සමාගම සඳහා ප්‍රමිතයේ 2 ඡේදය ප්‍රකාරව ඒකාබද්ධ කරන ලද මූල්‍ය ප්‍රකාශන 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම පිළියෙල කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12**

---

ප්‍රමිතයෙහි 27 ඡේදය ප්‍රකාරව, මණ්ඩලයේ බද්දට යටත්වන ලාභ නොලබනු ඇතැයි පුරෝකථනය කර නොතිබූ අතර විලම්භන බදු ගිණුම්ගත කිරීමක් ද කර නොතිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 13**

---

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ජීව විද්‍යාත්මක වත්කම් යටතේ වාණිජ වගාවන් ලෙස දක්වා ඇති රු.20,409,767 ක රබර්, රු 1,356,806 ක කජු හා රු. 1,370,774 ක වෙනත් වගාවන් අගය කර ඇති පදනම ප්‍රමිතයේ 91 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

---

(i) ප්‍රමිතයෙහි 7 ඡේදය ප්‍රකාරව වත්කමක් ලෙස හඳුනා ගැනීමට එහි පිරිවැය විශ්වාසනීය ලෙස අගය කළයුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති මණ්ඩලය විසින් භුක්තිවිඳින රු.225,189,438 ක් වටිනා ඉඩම් හෙක්ටයාර් 10,241.84 ක් අගය කළ පදනම හඳුනාගත නොහැකි විය.

(ii) ප්‍රමිතයේ 36 ඡේදය ප්‍රකාරව, යම් වත්කම් කාණ්ඩයක් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම් කාණ්ඩයට අයත් සියළු වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, මණ්ඩලය විසින් 2014 වර්ෂයේදී වාහන ප්‍රත්‍යාගණනය කිරීමේදී පිරිවැය රු. 60,960,579 ක් වූ වාහන 226 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(iii) ප්‍රමිතයෙහි 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 179 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 11,657ක් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුනද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය අවසානයට සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව ගොවිපල 14 ක විකිණීමට තීරණය කළ අයිතම 1205 ක් හා ඉවත් කිරීමට තීරණය කළ අයිතම 1399 ක් සම්බන්ධව ප්‍රමිතයේ 73 (ඉ) (ii) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(v) තාවකාලිකව අක්‍රීය දේපල, පිරියත හා උපකරණ වල ධාරණ අගය, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගය සහ ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගන්වා ඇති, විකිණීම සඳහා තබා ඇති වර්ගීකරණය නොකළ දේපල පිරියත හා උපකරණවල ධාරණ අගය පිළිබඳ තොරතුරු ප්‍රමිතයෙහි 79 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි.

(උ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17**

---

(i) ප්‍රමිතයෙහි 25 ඡේදය ප්‍රකාරව කල්බදු ණයහිමියන් ගිණුම්ගත කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය හෝ සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(ii) ප්‍රමිතයෙහි 31 (ආ) ඡේදය ප්‍රකාරව වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී අනාගත අවම කල්බදු ගෙවීම්වල එකතුව සහ ඒවායේ වර්තමාන අගය අතර සැසඳීමක් සහ ඊට අමතරව අස්ථිත්වය විසින් වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයේදී අනාගත කල්බදු ගෙවීම්වල එකතුව සහ ඒවායේ වර්තමාන අගය වර්ෂ 1ට අඩු, වර්ෂ 1 ත් වර්ෂ 5ත් අතර, සහ වර්ෂ 5ට වැඩි ලෙස අදාළ පරිදි හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඍ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

---

ප්‍රමිතයෙහි 57 ඡේදය ප්‍රකාරව සේවක ප්‍රතිලාභ අගය කරනු ලැබිය යුත්තේ පුරෝකතනය කළ ඒකක බැර ක්‍රමය අනුව වුවද, මණ්ඩලය විසින් සූත්‍ර ක්‍රමය මත පදනම්ව පශ්චාත් සේවක ප්‍රතිලාභ ගණනය කර තිබුණි.

(එ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20**

---

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 5 ක් සඳහා මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා ලබාදී තිබූ රු.166,248,476 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන, ප්‍රමිතයෙහි 24 ඡේදයට පටහැනිව, අයභාර ප්‍රදාන වශයෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.

(ඒ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36**

---

ප්‍රමිතයෙහි 9 ඡේදය ප්‍රකාරව මණ්ඩලයේ වත්කම් සඳහා වාර්ෂික හානිකරණ තක්සේරුව සිදුකරන බව මූල්‍ය ප්‍රකාශන සටහන් යටතේ දක්වා තිබුණද එවැනි හානිකරණ තක්සේරුවක් සිදු කර නොතිබුණි.

(ඔ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39**

---

ප්‍රමිතයෙහි 46 (අ) ඡේදය ප්‍රකාරව සේවක ණය හා ලැබිය යුතු දෑ මැනිය යුත්තේ සඵල පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැය මත පදනම්ව වුවද මණ්ඩලයේ සේවක ණය, ණය ගිවිසුමේ පොලී අනුපාතය මත පදනම්ව ගණනය කර ගිණුම් ගත කර තිබුණි.

(ඕ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40**

---

බදු දී ඇති ඉඩම් හෙක්ටයාර 380.8 ක් ප්‍රමිතයෙහි 6 ඡේදය ප්‍රකාරව ආයෝජන දේපල ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ක) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41**

---

(i) ප්‍රමිතයෙහි 43 ඡේදය ප්‍රකාරව පරිභෝජ්‍ය සහ ධාරක ජීව විද්‍යාත්මක වත්කම් හෝ මේරූ හෝ නොමේරූ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස උචිත පරිදි වෙන් කොට හඳුන්වමින් විස්තරයක් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 12 ඡේදය ප්‍රකාරව වාණිජමය වටිනාකමක් ඇති ගස් සාධාරණ අගයට මැනීම සඳහා එම වත්කම් වල අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම යොදා ගන්නා බව මූල්‍ය ප්‍රකාශන සටහන් යටතේ දක්වා තිබුණද රු. 734,086,827ක වටිනාකමක් සහිත වගාවන් එලෙස අගය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජීව විද්‍යාත්මක වත්කම් අගය කිරීම සම්බන්ධයෙන් නිකුත්කර තිබූ අංක 3/2017 දරන අභ්‍යන්තර චක්‍රලේඛය අනුව හාරගම, කරඳගොල්ල හා මිරිස්වත්ත ගොවිපලවල බිත්තර දමන කිකිළියන්, බොයිලර් කුකුළන් හා වටුවන් යන සතුන් 34,453 ක වටිනාකම රු.5,759,075 ක් වුවද එම වටිනාකම රු. 39,756,301 ක් ලෙස අගය කර තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ජීව විද්‍යාත්මක වත්කම් වටිනාකම රු. 33,997,226 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද, මැණික්පාලම ගොවිපලේ ආනයනික එළගවයන්ගේ වටිනාකම රු.25,011,620 ක් වැඩියෙන් අගය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල පශු සම්පත් තොගය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ගොවිපල 05 ක සත්ව කාණ්ඩ 07 කට අදාළව පශු සම්පත් තොගය, සමාලෝචිත වර්ෂයට අදාළ භෞතික සමීක්ෂණ වාර්තාවල ඇතුළත් වටිනාකමට වඩා රු.4,776,580 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි.

(ඇ) ජීව විද්‍යාත්මක වත්කම් අගය කිරීම සම්බන්ධ අංක 2/2017 දරන අභ්‍යන්තර චක්‍රලේඛය අනුව, හොරකැලේ ගොවිපොලේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී භෞතිකව සත්‍යාපනය කළ පොල් තොගය වන ගෙඩි 532,735 කින් සියයට 3 ක් අඩුකර අගය කර නොතිබුණි. තවද, ඒකක මිල වන වර්තමාන වෙළඳ පොළ මිල හෝ ගොවිපල විකුණුම් කරන ලද අවසාන වෙන්දේසි මිලෙන් අඩු අගය වන රු.37.30ක් වෙනුවට රු.61 බැගින් අගය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල අවසන් තොගය රු.12,757,497 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉඩම් පවරා ගැනීමේ මූලික ගාස්තු රු. 366,017 ක් පවරා ගත් ඉඩමේ වටිනාකමට ප්‍රාග්ධනිත කිරීම වෙනුවට ණයගැතියන් යටතේ දක්වා තිබුණි.

(ඉ) කිරි ව්‍යාපෘතියට අදාළව 2012 වර්ෂයේ සිට පැවත එන කිරි තොග ඌනතාවය 2016 ජනවාරි 01 දිනට රු.10,239,389 ක් වූ අතර එම ඌනතාවය 2016 දෙසැම්බර් 31 දිනට රු. 19,324,017ක් විය. මෙම තොග ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 760 ප්‍රකාරව කටයුතු කර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලාභය රු.9,084,628 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ සාමාන්‍ය තොග ශේෂය එක් එක් ගොවිපල හා එක් එක් ව්‍යාපෘති යටතේ භෞතික තොග සත්‍යාපන වාර්තා අනුව දක්වා තිබූ තොග වටිනාකමට වඩා රු.575,912 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ප්‍රධාන කාර්යාලය, ගොවිපල 32ක් හා ව්‍යාපෘති 4ක් වෙනුවෙන් ඒකාබද්ධ ශේෂ පිරික්සුමක් පිළියෙල කර නොතිබුණි. තවද ඉදිරිපත් කර ඇති ගොවිපල ගිණුම් වල වර්ගීකරණ දෝෂ පැවතීම සහ සම්මත වර්ගීකරණ ක්‍රමවේදයක් නොමැතිවීම මත, පරීක්ෂාකළ ගොවිපොළ අවසන් ගිණුම් වලට අදාළව හා නිලධාරීන්ගේ පැහැදිලි කිරීම් වලට අනුව එම ගිණුම් පිළියෙල කිරීමට අදාළව පහත අඩුපාඩු පැවතුණි.

(i) ගොවිපල ගිණුම් සමග ජර්නල් වවුචර් පිළියෙල කර නොතිබීම.

(ii) ගොවිපලවල ගනුදෙනු ගිණුම්ගත කිරීමේ හා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ඒකාකාරී ගිණුම් ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබීම.

(iii) ගොවිපල මූල්‍ය ප්‍රකාශයන්හි අයිතම හා අදාළ එක් එක් ශේෂ පිරික්සුමේ ශේෂ අතර එකඟ නොවීම් (වෙනස්කම්) පැවතීම.

(ඌ) 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කර විගණන වාර්තා වලින් පෙන්වා දෙන ලද පහත සඳහන් කරුණු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කර නොතිබුණි.

(i) 2015 වර්ෂය සඳහා ක්ෂය වෙන්කිරීම් රු.2,882,830 ක් අඩුවෙන් දක්වා තිබීම.

(ii) ආනයනය කරන ලද ගවයින් අතරින් 2015 වර්ෂය තුළ මිය ගොස් තිබූ ගවයන් 43 දෙනෙකුට අදාළ පිරිවැය වූ රු.18,661,613 ක් වර්ෂයේ ලාභයට ලියාහරිනු වෙනුවට රු.1,891,167ක් පමණක් ලියා හැරීම හේතුවෙන් 2016 වර්ෂයේ ආරම්භක සමුච්චිත ලාභය රු.16,770,446 කින් වැඩියෙන් දක්වා තිබීම.

(iii) 2015 වර්ෂය අවසානයට ප්‍රධාන කාර්යාලයේ අලෙවිසැලේ රු.766,879 ක් වටිනා භාණ්ඩ අයිතම 663ක තොග ඌනතාවය සම්බන්ධයෙන් අවශ්‍ය ගැළපීම් කිරීමකින් තොරව වෙළඳ හා අනෙකුත් තොග යටතේ දක්වා තිබීම හේතුවෙන් 2016 වර්ෂයේ ආරම්භක සමුච්චිත ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබීම.

(iv) පොත් අගය රු.148,172 ක් වූ වාහනයක් 2015 වර්ෂය තුළ රු.378,000 කට අලෙවි කර තිබූ අතර එහි පිරිවැය රු.214,190 ක් අඩුවෙන් බැහැර කිරීමේ ගිණුමට මාරු කර තිබීම හේතුවෙන් වත්කම් ගිණුම හා බැහැර කිරීමේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබීම.

(එ) වෙලාඩ් ව්‍යාපෘතිය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා භාණ්ඩාගාරය අතර ඇති කරගත් ප්‍රතිණය ගිවිසුමට අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ පළමු හා දෙවන අදියර සඳහා පිළිවෙලින් රු.1,963,095,836 ක් හා රු.3,145,519,017 ක් ලෙස එකතුව රු.5,108,614,853 ක ණය හා ඒ මත පොලිය රු. 177,176,940 ක් වන බව තහවුරු කර තිබුණි. එහෙත් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ණය පිළිවෙලින් රු.1,655,132,600 ක් හා රු.2,807,120,054 ක් ලෙස එකතුව රු.4,462,252,654 ක් ද ණය පොලිය රු.177,723,371 ක්ද ගිණුම්ගත කර තිබීම හේතුවෙන් පිළිවෙලින් රු.307,963,236 ක් හා රු.338,398,963 ක් ලෙස එකතුව රු.646,362,199 ක ණය අඩුවෙන්ද සහ ණය පොලිය රු.546,431 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි.

**2.2.3 නොසැසඳු පාලන ගිණුම්**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය හා ඊට අයත් ගොවිපලවල් සහ ව්‍යාපෘති අතර ගනුදෙනු සටහන් කරන ජංගම ගිණුම්, මුදල් හුවමාරු ගිණුම් හා වෙනත් පාලන ගිණුම් ඊට අදාළ එක් එක් ලෙජර් ගිණුම් සමග සැසඳුම් කර ගැලපීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය ආරම්භයට ලෙජර් ගිණුම් 518 කට අදාළව රු.4,938,627,905 ක නොසැසඳීම් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන කාර්යාලය හා ව්‍යාපෘති අතර සහ එක් එක් ව්‍යාපෘති අතර පාලන ගිණුම් සැසඳීම් නොකිරීම හේතුවෙන් පහත පරිදි නොසැසඳු ශේෂ පැවති බව නිරීක්ෂණය විය.

(i) ප්‍රධාන කාර්යාලයේ පොත්වල ප්‍රධාන කාර්යාලය හා එක් එක් ව්‍යාපෘති අතර පවතින පාලන ගිණුම් 03 ක රු. 45,210,173 ක හර ශේෂයක්ද පාලන ගිණුම් 04 ක රු. 31,073,532 ක බැර ශේෂයක්ද, ව්‍යාපෘති පොත් වල එක් එක් ව්‍යාපෘති හා ප්‍රධාන කාර්යාලය අතර පවතින පාලන ගිණුම් 2 ක රු.10,733,014 ක හර ශේෂයක්ද පාලන ගිණුම් 5 ක රු. 44,277,801 ක බැර ශේෂයක් ද විය.

(ii) ව්‍යාපෘති අතර පාලන ගිණුමකට අදාළව රු. 18,750,912 ක හර ශේෂයක් ද,පාලන ගිණුම් 5 කට අදාළව රු. 21,397,957 ක බැර ශේෂයක් ද විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කිරි ව්‍යාපෘතියේ ගිණුම් හා ෆාර්ම් ෂොප් ගිණුම් යටතේ පිළිවෙලින් ගොවිපල 11 ක් හා ගොවිපල 7 ක් වෙනුවෙන් ජංගම ගිණුම් හා තැන්පත් ගිණුම් යටතේ ගනුදෙනු සටහන් කරනු වෙනුවට කිරි ව්‍යාපෘතිය හා ෆාර්ම් ෂොප් ගිණුම්වල ගොවිපල ණයහිමියෙකු ලෙස පිළිවෙලින් එකතුව රු.13,296,469 ක් හා රු. 1,132,494 ක් දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන අනුව ගොවිපොල 17 ක් යටතේ වෙළඳ ණයගැති ශේෂය රු.51,352,663 ක් වුවද ඉදිරිපත් කළ උපලේඛන අනුව එම ශේෂය රු. 36,966,128ක් වූයෙන් රු.14,386,535 ක පැහැදිලි නොකළ වෙනසක් විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | ගිණුම් අයිතමය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ඉඩම් හෙක්ටයාර් 10,241.84 | 225,189,438 | අයිතිය සනාථ කිරීම සඳහා බදු ඔප්පු |
| (ආ) | ජීව විද්‍යාත්මක වත්කම් | | |
| | (i) පොල් යටි /නව වගාව | 681,802,453 | සමස්ත ශේෂය සඳහා එක් එක් ගොවිපල වෙනුවෙන් උපලේඛන හා තොග අගය කිරීම් වාර්තා. |
| | (ii) කජු වගාව | 1,356,806 | |
| | (iii) රබර් වගාව | 20,409,767 | |
| | (iv) තෘණ ස්ථාපිත කිරීම | 29,147,027 | |
| | (v) අනෙකුත් වගාව | 1,370,774 | |
| | (vi) ගොවිපල 09 ක සත්ව වර්ග 8 | 99,148,658 | තොග අගය කිරීම් වාර්තා |
| (ඇ) | ජංගම නොවන වත්කම් - වර්ෂයේ එකතු කිරීම් | | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ බව තහවුරු කර ගැනීමට අදාළ ලිපිගොනු හා වියදම සත්‍යාක්ෂණය කිරීමට අදාළ සාක්ෂි |
| | (i) යන්ත්‍ර උපකරණ | 2,462,967 | |
| | (ii) ව්‍යුහයන් | 8,622,341 | |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වසර 05 කට වඩා පැරණි ණයගැතියෝ | | |
| | (i) මහවැලි පශු සම්පත් සංවර්ධන සමාගම | 4,975,934 | ලැබිය යුතු ලෙස සනාථ කිරීමට අදාළ ලිඛිත සාක්ෂි හා ශේෂ සනාථ කිරීම්. |
| | (ii) රේඛීය අමාත්‍යාංශය | 10,512,864 | |
| | (iii) කන්තලේ ලංකා බැංකු ශාඛාවෙන් අයවියයුතු - 2009 වර්ෂයේ සිට පැවත එන ශේෂය | 2,092,150 | විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථ කිරීම්. |
| | (iv) ෆාර්ම්ෂොප් "පරණ" යටතේ වන ලැබිය යුතු ශේෂය | 2,770,757 | |
| | (v) පොල් තැරැව්කරුවන්ගේ ණයගැති ශේෂ | 10,678,072 | ශේෂ සනාථන |
| | (vi) 2007 වර්ෂයේ දී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවා තිබු මූලික ගාස්තුව | 366,017 | |
| (ඉ) | වසර 05 ට නොවැඩි ණයගැතියෝ | | |
| | (i) වෙළඳ හා අනෙකුත් ණයගැතියන් | 8,364,901 | විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථ කිරීම් |
| | ගොවිපල 7 | 132,445 | |
| | ව්‍යාපෘති 2 | | විස්තරාත්මක උපලේඛන |
| | (ii) කාර්ය මණ්ඩල ණයගැතියන් | | |
| | නිෂ්පාදන භාණ්ඩ විකිණීමෙන් | 3,589,115 | විස්තරාත්මක උපලේඛණ |
| | ණය අත්තිකාරම් | 26,434,718 | |
| | (iii) පොල් තැරැව්කරුවන්ගේ ණයගැති ශේෂ | 11,606,510 | ශේෂ තහවුරු කිරීමේ ලිපි |
| | (iv) පොල් ණයගැතියන්ගෙන් අයවිය යුතු දඩ මුදල් | 4,265,733 | කාල විශ්ලේෂණ |
| (ඊ) | පූර්ව වර්ෂ ගැලපුම් | 202,270,951 | ජ'නල් වවුචර්, සැසඳුම් ප්‍රකාශන |
| (උ) | සේවක ණය හිමියෝ, වෙළඳ හා අනෙකුත් ණයහිමියෝ -ගොවිපල 8 | 105,128,563 | විස්තරාත්මක උපලේඛන |
| (ඌ) | කිරි ව්‍යාපෘතියට අදාලව ස්ථාවර වත්කම් හා වසා දමා ඇති අලෙවිසැල් 109 ක පැවති ස්ථාවර වත්කම් | - | ස්ථාවර වත්කම් ලේඛන, ඉන්වෙන්ට්‍රි හා භෞතික පැවැත්ම සනාථ කරගත හැකි සාක්ෂි |

(එ) මණ්ඩලය විසින් රු.184,854,794 ක ණයගැති ශේෂ තහවුරු කිරීම සඳහා ලිපි 195 ක් යොමු කර තිබූ අතර ඉන් ලිපි 13 කින් රු.463,343ක ශේෂ තහවුරු කිරීම් පමණක් ලැබී තිබුණි. කොවුල්වැව ගොවිපල මගින් වතු සේවක සමූපකාර සමිතිය සඳහා රු.355,804 ක ශේෂයක් විමසමින් යොමු කරන ලද ශේෂ තහවුරු ලිපියට ශේෂයක් නොමැති බව දක්වමින් පිළිතුරු ලද අතර , රු.1,365,372ක වෙනත් ණයගැතියන්ට අදාළ ලිපි 15 ක ලිපිනයන් වැරදී ඇති බැවින් නැවත හරවා එවා තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලය, ගොවිපල 31 ක්, ප්‍රාදේශීය කාර්යාල හා ව්‍යාපෘති 5 ක් යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා වූ රු. 184,854,794 ක වෙළඳ හා අනෙකුත් ණයගැති ශේෂ තුළ වසරකට වැඩි ණයගැති ශේෂය රු.97,368,070 ක් වූ අතර ඉන් රු. 32,018,611 ක් හෙවත් මුළු ණයගැතියෙන් සියයට 17.3 ක් අවුරුදු 5 ඉක්මවා තිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට පැවත එන මියගිය ආනයනික ගවයින් වෙනුවෙන් ලැබිය යුතු රක්ෂණ වන්දි රු.19,253,926 ක් 2017 මැයි 31 දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී පශු සම්පත් මණ්ඩලයට පවරා ගෙන ඇති මහවැලි පශු සම්පත් සමාගමින් රු. 8,503,519 ක ණය ශේෂයක් වසර 3 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට වැවිලි මානව සංවර්ධනභාරය වෙතින් අයවිය යුතු රු.3,801,787 ක ශේෂයෙන් රු.111,963 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ අයවී තිබූ අතර ඉතිරි ශේෂය වූ රු.3,689,824 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම අයවී නොතිබුණි. තවද, 2011 නොවැම්බර් 02 දින ගෙවා තිබූ ඉහත ශේෂය තුළ ඇතුළත් රු. 2,957,521 ක් සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත් බව දක්වා තිබුණද එම අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවූ අතර සංස්ථාපිත අරමුණු වලින් බැහැරව එම මුදල ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) ආයතනයේ සේවකයන් වෙත මණ්ඩලයේ නිෂ්පාදන විකිණීමෙන් වර්ෂයකට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවති ණයගැති ශේෂය රු.1,530,648 ක් විය.

(ඊ) පොල් සංවර්ධන අධිකාරිය මගින් පවත්වනු ලබන පොල් වෙන්දේසි වලදී අධිකාරිය මගින් නිකුත්කර ඇති නීති මාලාවන්ට අනුව මණ්ඩලය විසින් කටයුතු නොකිරීම හේතුවෙන් තැරැව්කරුවන්ගෙන් අයවිය යුතු අවුරුදු 5 ට වැඩි රු.10,678,072ක ණය ශේෂයක්ද, අවුරුදු 3ට වැඩි අවුරුදු 5 ට අඩු රු. 3,855,731 ක ණය ශේෂයක්ද ඇතුලුව එකතුව රු.22,284,582 ක් වූ අතර එම හිඟ ණය ශේෂ අයකරගැනීමකින් තොරව එම තැරැව්කරුවන් වෙත දිගින් දිගටම පොල් අලෙවිකර තිබුණි.

(උ) ප්‍රධාන කාර්යාලය, ගොවිපල 32 ක් හා ව්‍යාපෘති 2 ක් යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 517,416,862 ක් වූ සේවක, වෙළඳ හා අනෙකුත් ණයහිමියන්ගෙන් වසරකට වැඩි ණයහිමි ශේෂය රු. 146,148,298 ක් වූ අතර ඉන් රු. 128,372,854 ක් හෙවත් මුළු ණයහිමියන්ගෙන් සියයට 25 ක් වසර 5 ඉක්මවා තිබුණි.

(ඌ) ගොවිපලවලට සත්ව ආහාර සැපයීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත ගෙවිය යුතු වසර 12 කට වඩා පැරණි ණය ශේෂය රු. 26,746,567 ක් හා වසර 5 කට වඩා පැරණි ණය ශේෂය රු. 279,450 ක්ද නියෝජිතයන් ගෙන් ලබාගෙන තිබූ වසර 2 ක කාලයක සිට පැවත එන අත්තිකාරම් රු. 2,009,370 ක්ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මණ්ඩලය විසින් 2003 වර්ෂයේදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලබාගෙන තිබූ රු.102,662,750 ක් වූ ණය මුදලින් වර්ෂ 13 ක් තිස්සේ හිඟ හිටව තිබූ ණය ශේෂය රු.93,612,700 ක් විය. ඊට අදාළ පොළිය වූ රු.87,757,178 ක් සමග සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුළු මුදල රු.181,369,878 ක් වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.9,487,130 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.34,840,106 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.25,352,976 කින් පිරිහී තිබුණි. මෙහෙයුම් ආදායම් රු.768,047,375 කින් හා වෙනත් ආදායම් රු.11,693,880 කින් වැඩිවී තිබුණද රාජ්‍ය ප්‍රදාන රු.35,791,275 කින් අඩු වීමත් විකුණුම් පිරිවැය, පරිපාලන වියදම හා මූල්‍ය වියදම් පිළිවෙලින් රු.607,107,075 ක්, රු.151,437,450 කින් හා රු. 33,245,554 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

තවද, ප්‍රාග්ධන ප්‍රදාන රු.24,729,602 ක් අයභාර ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ අලාභය රු.මිලියන 26.29 ක් වූ අතර 2013 වර්ෂයේදී එය තවදුරටත් රු.මිලියන 86.08 ක් දක්වා වර්ධනය වී තිබුණි. එහෙත් 2014 හා 2015 වර්ෂවලදී එම අලාභය පිළිවෙලින් රු.මිලියන 60.23 ක් හා රු.මිලියන 34.84 ක් දක්වා අඩු වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 9.487 ක අතිරික්තයක් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.මිලියන 110.18 ක් වූ ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 263.77 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

| | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2016 | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
| ජංගම අනුපාතය | 0.37 | 0.42 | 0.79 | 0.99 | 1.11 | 1.31 |
| ක්ෂණික අනුපාතය | 0.21 | 0.24 | 0.51 | 0.66 | 0.73 | 0.65 |
| දළ ලාභ අනුපාතය | 32.38% | 37.25% | 37.32% | 34.31% | 14.35% | 29.60% |
| ශුද්ධ ලාභ අනුපාතය | 0.33% | 1.85% | 3.12% | -6.70% | 2.09% | 19.00% |
| ණයගැති පිරිවැටුම් අනුපාතය | 16.92 | 11.86 | 9.86 | 6.14 | 7.90 | 21.20 |
| ස්ථාවර වත්කම් පිරිවැටුම් අනුපාතය | 0.91 | 0.85 | 1.23 | 0.94 | 1.34 | 3.98 |
| තෝලන අනුපාතය | 3.35 | 3.47 | 1.76 | 1.99 | 1.16 | 0.34 |
| ණයගැති එකතුකිරීමේ කාලය | 21.57 | 30.77 | 37.01 | 59.43 | 46.20 | 17.21 |

2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මණ්ඩලයේ ද්‍රවශීලතා අනුපාත අඛණ්ඩව පහල ගොස් තිබූ අතර ඉදිරි මාස 12 තුළ ගෙවිය යුතු ණය ප්‍රමාණය අඛණ්ඩව වැඩිවීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. ඒ අනුව ද්‍රවශීලතා ගැටළු පැන නැගීමේ අවදානමක් පැවතිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, මූල්‍ය හා පරිපාලන වියදම් අධික වීම හේතුවෙන් මණ්ඩලයේ ශුද්ධ ලාභ අනුපාතය 2014 වර්ෂයේ සිට ක්‍රමයෙන් අඩුවී තිබූ අතර වෙලාඩ් ව්‍යාපෘතිය සඳහා හා වෙනත් දිගු කාලීන ණය හේතුවෙන් මණ්ඩලය අධි තෝලන තත්ත්වයක් පෙන්නුම් කර තිබුණි. ඒ අනුව ද්‍රවශීලතා අවදානම හා අධිතෝලනය හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටළු මතු විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වික්‍රණුම් ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් පුද්ගලික සමාගමකට එරෙහිව රු.2,093,175 ක වන්දි ඉල්ලීම් නඩුවක් ද මරදවිල ඉඩමක අයිතිය සඳහා බාහිර පාර්ශව 2 කට එරෙහිව නඩු 2 ක් ද මණ්ඩලය විසින් පවරා තිබුණි. තවද, අනවසරයෙන් වගා කරන ඉඩම් හා ගල්කොරියන් දෙකක් නැවත ලබා ගැනීමට එම පාර්ශවයන් විසින් ගොනු කළ නඩු 4 ක් ද මණ්ඩලයේ සේවකයින් 07 දෙනෙකු විසින් තම සේවය අත්හිටුවීමට විරුද්ධව ගොනු කළ නඩු 07ක් ද පොලීසිය හා දිසා අධිකරණය විසින් ගොනු කළ නඩු 02 ක් ද ලෙස මණ්ඩලයට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් නඩු 13 ක් ගොනුකර තිබුණි.

(ආ) පෞද්ගලික ආයතනයක් වෙත විකිණීම සඳහා ලබාදී තිබුණු බඩඉරිඟු සඳහා මණ්ඩලයට අයවියයුතු රු.11,947,220 ක් අයකර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව විසින් පිස්කල් ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර තිබු නමුත් 2016 ජුනි 30 දින වන විටද එම මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය හා 1975 පෙබරවාරි 14 දිනැති අංක 151 දරන ගැසට් පත්‍රයේ පලකළ සංශෝධනයට අනුව මණ්ඩලය විසින් ඉටු කළ යුතු කාර්යයන් පහත පරිදි වේ.

(i) සාධාරණ මිලට මස් පිණිස සතුන් මිලට ගැනීම සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම.
(ii) නිෂ්පාදන සකස් කිරීම සහ අලෙවිකිරීම.
(iii) සතුන්ගේ කුණප සැපයීම පිණිස, ප්‍රාදේශීය ඝාතනාගාර පිහිටුවීම, ඒ දක්වා ප්‍රවාහනය කිරීම සහ හඳුනා ගැනීම පිණිස මුද්‍රා තබන ලද කුණප ඝාතනාගාරවල සිට බලයලත් වෙළඳුන් වෙත ප්‍රවාහනය කිරීම.
(iv) මස් සහ මාංශ නිෂ්පාදනය සකස් කිරීම සහ අලෙවි කිරීම, අලෙවි කිරීමේ බලපත්‍ර නිකුත් කිරීම සහ ඒ කාර්යයන් විධිමත් කිරීම හා අතුරු නිෂ්පාදනයන්ගෙන් උපරිම ප්‍රයෝජනය ගැනීමට වග බලා ගැනීම.
(v) වෙළඳාම සඳහා බලයලත් වෙළඳුන්ට බෙදා හැරීම පිණිස වෙළඳාමට සුදුසු පරිදි කැබලි කළ ඉස්තරම් මස්, පැකට්වල ඇහිරීමෙන් සහ මිළ ගණන් ලකුණු කිරීමෙන් පිළියෙල කිරීම.
(vi) සතුන් ඇති කිරීමට අවශ්‍ය (රේනස් ද ඇතුළුව) බෝකරන සතුන්, ඖෂධ, තැවීම් ආකල, යන්ත්‍ර සහ උපකරණ වැනි දේවල් ආනයනය කිරීම හා සැපයීම.
(vii) මණ්ඩලයේ සාමාන්‍ය ව්‍යාපාරයට අනුයාතව මණ්ඩලය විසින් වැඩදායි ලෙස පවත්වා ගෙන යා හැකි යයි මණ්ඩලය හා මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් අදහස් කරන සත්ව පාලන ගොවිපළවල් හා වෙනත් ව්‍යාපාර ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම.

සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තාවට අනුව මණ්ඩලයේ අරමුණුගත කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉහත කාර්යයන් අතුරින් මස් පිණිස සතුන් මිලට ගැනීම සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම හා සතුන්ගේ කුණප සැපයීම පිණිස, ප්‍රාදේශීය ඝාතනාගාර පිහිටුවීම, ප්‍රවාහනය කිරීම සහ හඳුනා ගැනීම පිණිස මුද්‍රා තබන ලද කුණප ඝාතනාගාරවල සිට බලයලත් වෙළඳුන් වෙත ප්‍රවාහනය කිරීම යන කාර්යයන් මණ්ඩලය විසින් වර්තමානයේ ඉටු කරනු නොලැබේ.

(ආ) මණ්ඩලය සතු ගොවිපල 32 ක 2016 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තා මගින් පශු සම්පත් වල භෞතික ප්‍රගතිය පමණක් ඉදිරිපත් කර තිබු අතර, ගොවිපලවල කෘෂි, අනෙකුත් වගාවන් හා ඉදිකිරීම් ආදියේ ප්‍රගතිය සහ ප්‍රධාන කාර්යාලය හා මණ්ඩලයේ පවතින ව්‍යාපෘතිවල ප්‍රගතිය

ඇතුලත්ව සමස්ත ආයතනයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය දැක්වෙන කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයට අදාළව මණ්ඩලය විසින් විගණනයට ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තා සැසඳීමේදී ගොවිපල 32 ක් යටතේ වූ ව්‍යාපෘති 09 කට අදාළව ක්‍රියාකාරකම් 382 ක් සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ගොවිපල 20 ක ව්‍යාපෘති 08 කට අදාළ ක්‍රියාකාරකම් 54 ක් 2016 වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබූ අතර ගොවිපල 25 කට හා ව්‍යාපෘති 08 කට අදාළව ක්‍රියාකාරකම් 68 ක ප්‍රගතිය සියයට 1 ත් සියයට 49 ත් අතර පැවතුණි. ඒ අනුව අදාළ කාර්යයන් ක්‍රියාත්මක නොකිරීමට හා නිසි පරිදි ඉටු නොකිරීමට හේතු දක්වා නොතිබුණි.

(ii) ගොවිපොල 04 ක ව්‍යාපෘති 03 කට අදාළව 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණු ක්‍රියාකාරකම් 04 ක් කාර්යසාධන වාර්තාවේ ඉලක්කයන් හා නොගැලපුණි.

(iii) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ගොවිපොල 03කට හා ව්‍යාපෘති 02 කට අදාළ ක්‍රියාකාරකම් 07ක් සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

(iv) ගොවිපොල 09 ක ව්‍යාපෘති 05 කට අදාළව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 14 ක් සඳහා 2016 වර්ෂයේ ඉලක්ක ඇතුළත් කර නොතිබුණි.

**4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

-----------------------------

(අ) මණ්ඩලය සතු ගොවිපලවල් 32 ක් අතුරින් එක් ගොවිපලක් පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන ගොස් තිබූ අතර අනෙකුත් ගොවිපලවල් අතුරින් පසුගිය වසර 5 තුළ ගොවිපලවල් 19 ක් ලාභ ලබන තත්ත්වයක හා ගොවිපලවල් 12 ක් දිගින් දිගටම පාඩු ලබන තත්ත්වයක පැවතුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය ඇතුලුව ගොවිපලවලින් ලබාදී තිබූ සමුච්චිත අලාභය රු.661,307,034 ක් වූ අතර මෙසේ දිගින් දිගටම අලාභ ලබන ගොවිපලවල් අලාභ ලැබීමට හේතු සොයා බලා ලාභ ලබන තත්ත්වයකට පත්කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මණ්ඩලය විසින් ගෙන නොතිබුණි. තවද, 2011 වර්ෂයේ ආරම්භ කළ කිරි ගව ආනයන ව්‍යාපෘතියේ 1 වන අදියර ක්‍රියාත්මක වූ බෝපත්තලාව, ඩයගම හා මැණික්පාලම යන ගොවිපලවල් තුනම අඛණ්ඩව අලාභ ලබා තිබූ අතර ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 174,150,906 ක අලාභ ලබා තිබුණි.

(ආ) මණ්ඩලය විසින් වෙලාඩ් රුරල් එක්ස්පෝට්ඩ් පුද්ගලික සමාගම සමග අදියර 2 ක් යටතේ කිරි ගවයින් ආනයනය කිරීම සඳහා පළමු අදියර යටතේ 2010 අගෝස්තු 19 දින ඇමෙරිකානු ඩොලර් 12,944,058 ක් හා දෙවන අදියර යටතේ 2014 ජුලි 24 දින ඇමෙරිකානු ඩොලර් 20,747,293 ක් ලෙස ණය ගිවිසුම් දෙකකට එළඹ තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉහත ණය සඳහා 2016 දෙසැම්බර් 31 මණ්ඩලය ගෙවිය යුතු වාරික මුදල හා පොලිය රු.1,339,517,078 ක් වී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට පොලී වශයෙන් රු.24,812,576 ක් පමණක් ගෙවා තිබුණි. පළමුවන හා දෙවන අදියර යටතේ ලද ගවයින් වෙනුවෙන් මණ්ඩලයට දෛනිකව විශාල මුදලක් වැය කිරීමට සිදුවී ඇති බැවින් මෙම වාරික මුදල මණ්ඩලයට දැරීමට අපහසු බව මණ්ඩලයේ සභාපති විසින් 2017 දෙසැම්බර් 22 දිනැති අංක එන්එල්ඩීබී/එෆ්අයිඑන්/024/98 දරන ලිපියෙන් විගණනය වෙත දන්වා තිබුණි.

(ii) 2014 ජුලි 24 දින මණ්ඩලය හා පුද්ගලික සමාගම අතර ගිවිසුමට අනුව, වෙලාඩ් ව්‍යාපෘතියේ II වන අදියර ක්‍රියාත්මක කිරීමට පෙර පත්කර ඇති කමිටුවේ තීරණ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවයද මත ක්‍රියාත්මක කිරීම පිණිස 2015 මැයි 28 දින අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී තිබුණද එම යෝජනා ක්‍රියාත්මක කිරීම නිසි පරිදි සිදුවී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

- ජර්සි වර්ගයේ දෙනුන් හැකි උපරිමයෙන් ලබා දීමට සමාගම එකඟ වූ බව ගිවිසුම අනුව දක්වා ඇති නමුත් 2015 ජුලි 13 දින මෙරටට භාරදෙන ලද සතුන් 1181 කින් සතුන් 532 ක් ද , 2015 ඔක්තෝබර් 12 දින මෙරටට භාරදෙන ලද සතුන් 1314 කින් සතුන් 521 ක් පමණක් ජර්සි වර්ගයේ දෙනුන් විය.
- ණය නැවත ගෙවීම් කළ යුතු ආකාරය විශේෂ කමිටුවක් මගින් තීරණය කිරීමට යෝජනා කර තිබුණද විගණිත දිනය වූ 2017 පෙබරවාරි 08 දින දක්වාම එම කමිටුව පත් කර නොතිබුණි.
- රිදීගම ගොවිපලේ සතුන් දීර්ඝ කාලීනව පවත්වා ගැනීමට කටයුතු කරන්නේ නම් කෘත්‍රිම පාරිසරික තත්ත්වයක් ඇතිකිරීම සඳහා විදුලිය සඳහා වැය වන පිරිවැය (2015 වර්ෂයේ රු.5,729,028 ක්වූ අතර 2016 වර්ෂයේදී රු. 39,993,949 ක් දක්වා වැඩිවී තිබීම) අවම කිරීමට විකල්ප ක්‍රම වේදයක් (සූර්යය ශක්තිය ) සඳහා යොමු වීමට යෝජනා කර තිබූ නමුත් ඒ සම්බන්ධව 2017 ජුලි 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(iii) මෙම ව්‍යාපෘතියෙහි කාර්යයන් අධීක්ෂණය හා මෙහෙය වීම, මූල්‍ය කළමනාකරණය සඳහා අදාළ විෂය භාර අමාත්‍යාංශය, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, වෙලාඩ් රූරල් එක්ස්පෝටර්ස් පුද්ගලික සමාගමේ හා මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයන්ගෙන් මෙහෙයුම් ඒකක පත් කිරීමට නිර්දේශ කර තිබුණි. එහෙත් එම කමිටුව පත්කර නොතිබූ අතර එම කමිටුවේ නිර්දේශ පරිදි භාවිතා කිරීමට දක්වා තිබූ මානව සම්පත් සංවර්ධනය, වැඩසටහන්ගත අධීක්ෂණ වියදම්, අමතර කොටස් ද ඇතුළු ගොවිපල නඩත්තු කිරීම සහ තාක්ෂණික නඩත්තු කිරීම හා ධාරිතාව ගොඩනැංවීමේ වියදම් සඳහා ගිවිසුම්ගත මුදල වන එකතුව එ.ජ.ඩොලර් ($) 506,333 ක් වන රු. 70,690,202 ක් එම නිර්දේශ නොමැතිව වැයකර තිබුණු අතර එම වියදම් තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි ද විගණනයට ඉදිරිපත් නොවිණි.

(iv) 2015 මැයි 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා 2015 මැයි 20 දිනැති මුදල් අමාත්‍යාංශ සටහනේ 2019 වසර දක්වා තාක්ෂණික සේවා සැපයීමට එකඟ වූ බව දක්වා තිබුනද එවැනි දිගු කිරීමක් සඳහා ඇති කරගත් ගිවිසුමක් ඉදිරිපත් කර නොතිබුණි. ව්‍යාපෘතිය සම්පූර්ණ බවට හා සතුටුදායක ලෙස වැඩ අවසන් කළ බවට සහතික නිකුත් කිරීමෙන් තොරව එ.ජ.ඩොලර් 1,037,135 කට සමාන වූ රු.152,355,158 ක සම්පූර්ණ රඳවා ගැනීමේ ගාස්තුව ගෙවා තිබුණි.

(v) මෙම ව්‍යාපෘතියෙහි 2 වන අදියර 2014 ජුලි 14 දින සිට වර්ෂ 2ක් තුළ දී නිමකිරීමට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා වෙලාඩ් රූරල් එක්පෝටර්ස් සමාගම ගිවිසුමකට ඇතුළත්වී තිබුණි. ඒ අනුව, එක් සතෙකු එ.ජ. ඩොලර් 3032.87 ක් බැගින් සතුන් 2,500 ක් ආනයනය සඳහා එකඟවී තිබූ නමුත් 2015 වර්ෂයේ ජුලි 13 හා ඔක්තෝබර් 12 යන දිනවල ගවයන් 2,495 ක් පමණක් ආනයනය කර තිබුණි. රඳවාගැනීමේ මුදල් ද ඇතුලත්ව 2016 ඔක්තෝබර් 11 දින වන විට එ.ජ.ඩොලර් 7,576,101.28 ක් ලෙස ගිවිසුම්ගත මුදලට වඩා එ.ජ.ඩොලර් 9098.59 ක් එනම් රු.1,336,583 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කිරි ව්‍යාපෘතියට අදාළව අලෙවිසැල් ආරම්භ කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබීම හේතුවෙන් 2002 වර්ෂයේදී ආරම්භ කර තිබූ අලෙවිසැල් 152 කින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ක්‍රියාත්මකව පැවති අලෙවි සැල් සංඛ්‍යාව 43 ක් වූ අතර, ඒ අතරින් අලෙවිසැල් 19 කින් සමාලෝචිත වර්ෂය තුළ රු. 2,459,924 ක අලාභ ලබා තිබුණි.

(ආ) අඹේවෙල ගොවිපල වෙනුවෙන් 1992 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයෙන් ලබා ගෙන තිබුණු රු.50,000,000 ක පොළී රහිත ණය මුදල, එම ගොවිපල නැවත 2001 ඔක්තෝබර් 03 දින පෞද්ගලීකරණයේදී නිරවුල් කර නොතිබුණු අතර, ණය මුදල පියවා ගැනීම සඳහා ඉදිරි වැඩපිළිවෙලක්ද 2017 අගෝස්තු 31 දින දක්වා ම සකස් කර නොතිබුණි.

(ඇ) 2016 පෙබරවාරි 11 දිනැති අංක අමප/16/0125/732/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා යුධ හමුදාව යටතේ පාලනය වූ කන්දකඩුව සහ ත්‍රිකෝණමඩු ගොවිපලවල් නැවත මණ්ඩලය වෙත පවරාගැනීමට තීරණය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර මේ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කන්තලේ උක් වගා භූමියේ අක්කර 1,000 ක ඉඩමේ බඩ ඉරිඟු ව්‍යාපෘතියක් වෙනුවෙන් නැගෙනහිර නවෝදය යටතේ චක්‍රීය අරමුදලක් ඇති කිරීමට 2007 ජුනි 28 දින මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 37.50 ක් ලබා දී තිබුණි. එම ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් 2011 සැප්තැම්බර් 11 දින වන විට චක්‍රීය අරමුදලේ පැවති රු.17,549,342 ක ශේෂය 2007 ජුනි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයට ලබා දිය යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබූ අතර එයින් රු.13,295,637 ක් ස්ථාවර තැන්පතු යටතේ ආයෝජනය කර තිබුණි.

(ආ) ජීව විද්‍යාත්මක තොග යටතේ සතුන් අගය කිරීමට පිළියෙල කර ඇති අංක 03/2017 දරන මණ්ඩලයේ චක්‍රලේඛය තර්කානුකූල පදනමකින් පිළියෙල කර නොමැති බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

(i) දේශීය හා ආනයනික ගවයන් අගය කිරීමේදී භාවිතා කළ ක්‍රමවේදයෙහි ඇතුළත් ජීව බර වටිනාකම ලබා ගැනීමේදී භාවිතා කළ රේටයන්හි විශාල වෙනසක් නිරීක්ෂණය විය. දේශීය ගවයන් සඳහා ජීව බර කිලෝ ග්‍රෑම් එකක් රු. 92 සිට රු. 200 දක්වා ද ආනයනික ගවයන් සඳහා රු.110 සිට රු.910 දක්වා පරාසයක වූ අතර මෙම රේටයන් සැකසීමට අනුගමනය කළ ක්‍රියාදාමය විනිවිදභාවයෙන් යුතුව හඳුනාගත හැකි පරිදි සැකසූ බවට නිරීක්ෂණය නොවීම.

(ii) ගැබ් නොගත් නැම්බියන් (Heifers) අගය කිරීමේදී ජීව බර අනුව අගය කර එම අගයට කිරි වටිනාකම (ගොවිපල දෛනික සාමාන්‍ය කිරි නිෂ්පාදනය x රු.1,000) එකතු කළ යුතු බව දක්වා තිබීම.

(iii) ගොවිපලවල් 7 ක ගැබ් නොගත් නැම්බියන් (Heifers) අගය කිරීමේදී සතුන් 1,377ක් මණ්ඩලයේ අංක 03/2017 දරන චක්‍රලේඛ උපදෙස් පරිදි අගය කර නොතිබූ අතර වෙනත් ගොවිපොල 9 ක කිරි ලබා දෙන සතුන්ගේ දෛනික සාමාන්‍ය කිරි නිෂ්පාදන ලීටර ගණන මත නැම්බියන් (Heifers) 1757 කට අදාළව රු.10,051,700 ක කිරි වටිනාකමක් ජීව බර අගයට එකතු කර දක්වා තිබීම.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

මණ්ඩලයට අයත් ගොවිපලවල් 7 ක සේවක නිවාස 54 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

**4.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/ දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම**

1974 හා 1992 යන වර්ෂවල සිට පවත්වාගෙන යන ගොවිපල 24 කට අයත් හෙක්ටයාර් 10241 ක ඉඩම්වල අයිතිය විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව එම ගොවිපල තුළ මණ්ඩලය විසින් රු. 194,565,192 ක් වටිනා ගොඩනැගිලි හා රු.701,358,733 ක් වටිනා ව්‍යුහයන් ඉදිකර තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

2007 අගෝස්තු 24 දිනැති අංක 9 / 2007 (1) ඕ දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (i) හා (iv) ඡේදයට පටහැනිව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව පත් කර තිබූ උපදේශකයින් 5 දෙනා අතරින් පශු වෛද්‍ය උපදේශකවරයා හැර සෙසු උපදේශකවරුන් 4 දෙනා වෙත සේවා කොන්දේසි (Terms of reference) ලබා දී නොතිබුණි. එසේම උපදේශකවරුන්ගේ කාර්යසාධන වාර්තා හා පැමිණීම් පිළිබඳ වාර්තා සනාථ කරගැනීමකින් තොරව ඉකුත් වර්ෂයේ දී රු.1,305,665 ක් හා සමාලෝචිත වර්ෂය තුළ දී රු.2,294,423 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

**4.8 වෙළඳපල දායකත්වය**

ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ හා මහ බැංකු වාර්ෂික වාර්තා අනුව සමාලෝචිත වර්ෂය තුල රටෙහි සමස්ථ කිරි නිෂ්පාදනය ලීටර 384,008,400 ක්ද පොල් නිෂ්පාදනය ගෙඩි 3,011,000,000 ක්ද කුකුළු නිෂ්පාදනය සතුන් 21,056,020 ක් ද වූ අතර එයින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි නිෂ්පාදනය ලීටර 17,936,997 ක් ද පොල් නිෂ්පාදනය ගෙඩි 21,000,000 ක්ද කුකුළු නිෂ්පාදනය සතුන් 2,762,213 ක්ද පමණක් විය. ඒ අනුව මණ්ඩලයේ දායකත්වය කිරි නිෂ්පාදනයෙන් සියයට 4.67 ක්, පොල් නිෂ්පාදනයෙන් සියයට 0.7 ක් හා කුකුළු නිෂ්පාදනයෙන් සියයට 13.12 ක්ද වූයෙන් දායකත්වය ඉතා පහළ මට්ටමක පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත්තේ 2017 ජූනි 16 දින දීය.

**5.2 සංයුක්ත සැලැස්ම**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ යාවත්කාලීන කළ සංයුක්ත සැලැස්ම 2016 ඔක්තෝබර් 27 දින අනුමත කර 2017 ජූලි 12 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(i) වර්තමානයේ ආයතනය සතුව පවතින සම්පත්
- ප්‍රධාන කාර්යාලයීය ඉඩම්,ගොඩනැගිලි පිළිබඳ තොරතුරු
- නිෂ්පාදන සහ මෙහෙයුම් පහසුකම්
- මානව සම්පත හා කළමනාකරණ කුසලතා
- තාක්ෂණික දැනුම
- වෙළඳපොළවල් හා සැපයුම්කරුවන්

( ii) සංවිධාන ව්‍යුහය.

( iii) සැලසුම්කාල සීමාව තුළ ඉටුකළ යුතු ඉලක්ක හා අරමුණු සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කළමනාකරණ වගකීම.

(iv) ජාතික පශු සම්පත් මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ඩිලයිට්, වරලත් අලෙවිසැල්, කිරි ව්‍යාපෘති හා ප්‍රදාන කාර්යාලයීය අලෙවිසැල යන ව්‍යාපෘතින් සම්බන්ධව තොරතුරු.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම පදනම් කරගෙන ඉදිරි මුදල් වර්ෂයේ ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් කර සමස්ත ආයතනයට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය හා ව්‍යාපෘති 4 ක ක්‍රියාකාරකම් හා පහත කරුණු ඇතුළත් කිරීමකින් තොරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි.

(i) වාර්ෂික අයවැය ලේඛනයේ ඇතුළත් විය යුතු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(ii) ණය ආපසු ගෙවීමේ සැලැස්ම

(iii) යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

(ආ) තොරතුරු තාක්ෂණික අංශය විසින් 2016 වර්ෂය සඳහා අයවැය ගත කරන ලද හා ප්‍රසම්පාදන සැලැස්ම තුල ඇතුලත් රු. මිලියනයක් වන මාර්ගගත වෙන්කිරීම් පද්ධතියක් හා රු. මිලියන 8ක් වන Enterprises Resource Planing (ERP) පද්ධතිය මිලදී ගැනීමට අපේක්ෂා කර තිබුණද එය මිලදීගෙන නොතිබුණි. තවද එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සේවක බඳවා ගැනීම් සහ සේවක පුහුණු කිරීම් ආදිය 2016 ක්‍රියාකාරී සැලැස්ම තුළ හඳුනාගෙන නොතිබුණි.

(ඇ) ගොවිපලවල් සඳහා ලද ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර තිබුණද ඒ තුළ ඇතුලත් ක්‍රියාකාරකම්වල කාර්තුමය වශයෙන් අපේක්ෂිත භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය දක්වා නොතිබුණි.

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඇතුළත් සියලුම මිල දී ගැනීම්වල ආරම්භක දිනය 2016 ජනවාරි 01 හා අවසාන දිනය 2016 දෙසැම්බර් 31 දින ලෙස දක්වා තිබූ අතර එම මිලදී ගැනීම් සිදුකළ යුතු නිශ්චිත කාලසීමාවක් සඳහන් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ගොවිපල 16 ක අයිතම 36 ක ප්‍රසම්පාදනය සඳහා අනුමැතිය ලද ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් වටිනාකම් රු.23,757,800 ක් හා අයවැය ලේඛනයේ ඇතුලත් වටිනාකම් රු.33,343,600 ක් අතර එකිනෙකට නොගැලපෙන අවස්ථා පැවතුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොවිපල 22 ක අයිතම 82 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් කර තිබුණ ද ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන අයවැය මගින් වෙන්කරගෙන නොතිබුණි.

(ආ) 2016 - 2020 දක්වා සඳහා පිළියෙළ කරන ලද සංයුක්ත සැලැස්ම මගින් ආයතනයේ පුහුණුවීම් මධ්‍යස්ථාන මගින් කිරිපට්ටි කළමනාකරණ පුහුණු වැඩසටහන් හා උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන්ට ගොවිපල ආශ්‍රිත පුහුණුව සඳහා (බෝපත්තලාව, ඩයගම,මැණික්පාගම,රිදියාගම) පහසුකම් සපයන බවට සඳහන් වී තිබුණද 2016 වර්ෂයේ අයවැය තුළ හා ක්‍රියාකාරී සැලැස්ම තුළ ඒ සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් හෝ ඇතුලත් කර නොතිබුණි.

(ඇ) 2015 නොවැම්බර් 24 දින පැවති 469 වන අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ දී රොසිටා ගොවිපොලේ නව කිරි ගවයන් ගාල් කිරීමට අවශ්‍ය පහසුකම් ඇති කිරීම සඳහා මුදල් වෙන් කිරීමට අනුමැතිය ලැබී තිබුණ ද එය අයවැය ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) 2016 ජූනි 28 දින පැවති 475 වන අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ දී හොරකැලේ ගොවිපොලේ ඌරු ගාල ඉදිකිරීම සඳහා අනුමැතිය ලැබී තිබුණ ද ඒ පිළිබඳව අයවැය ලේඛනය තුළ හා ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඇතුළත් වී නොතිබුණි.

**5.6 නොවිසඳී ඇති විගණන ඡේද**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ බැංකු ණය මත ක්‍රියාත්මක වෙලාඩ් එළගව ව්‍යාපෘතිය මගින් 2013 වර්ෂයේදී වැය කර මැණික් පාලම ගොවිපල යටතේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කරන ලද රු. 80,604,253 ක් 2014 වර්ෂයේදී අයහාර වියදමක් ලෙස සමුච්චිත ආදායමට කපාහැර තිබුණි. මෙම වියදම අයහාර වියදමක් ලෙස ලියා හැරීම හේතුන් සහ එම වියදම තහවුරු කිරීමට අදාළ කිසිදු සාක්ෂියක් මෙම වාර්තාවේ දින දක්වාම විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) මණ්ඩලයට අයත් ගොවිපලවල පිහිටි නිවාස 70ක සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) ගොවිපල ගිණුම් පිළියෙල කිරීමේදී ඇතැම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම.<br>(ii) ජර්නල් සටහන් සඳහා ජර්නල් වවුචර පිළියෙල නොකිරීම. |
| (ආ) | ගොවිපල ජීව විද්‍යාත්මක වත්කම් අගය කිරීම. | තොග අගය කිරීම ස්වාධීන පුද්ගලයකු මගින් සිදු නොකිරීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවා ගැනීම් අයදුම්පත් කැඳවීම, සම්මුඛ පරීක්ෂණ සඳහා මණ්ඩලය විසින් ලකුණු ලබා දීම හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වෙත එම තොරතුරු ඉදිරිපත් කිරීම විනිවිදභාවයෙන් යුතුව සිදු නොකිරීම. |